# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2371/33 - 2024 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 ජූලි මස 06 දිනැති අංක 2235/22 දරන රජයේ *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග), මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

i. මෙම නියෝගවල උපලේඛනයෙහි I වන කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (12) වන අනුඡේදය ලෙස පහත අයිතමය ඇතුළත් කරනු ලැබේ.

(12) "උපලේඛනයේ මෙම කොටසේ "අ" ශීර්ෂය යටතේ 7 සහ 8 ඡේදවල සඳහන් බැහැර කිරීම් සහ සීමා කිරීම් වලට යටත්ව, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී නිෂ්කාශන ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද රීති ප්‍රකාරව, 'සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට ලබා දීම' යන ගනුදෙනු යටතේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත ඕනෑම සුරැකුම්පතක්, අත්පත් කරගැනීම, දැරීම, අත්හැර දැමීම හෝ ඇපකරයක් ලෙස ඔඩපනය කිරීම."


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ii. මෙම නියෝගවල උපලේඛනයෙහි I වන කොටසේ "අ" ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ 1 වන අනුඡේදයෙහි (ඊ) අයිතමය ලෙස පහත අයිතමය ඇතුළත් කරනු ලැබේ.

(ඊ) "නේවාසික නොවන ආයෝජකයන් විසින්, උපලේඛනයෙහි I වන කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (12) වන උපඡේදය යටතේ සිදු කරන ලද අවසරලත් ගනුදෙනුවක් වෙනුවෙන්, ගාස්තු, නිෂ්පාදිත ගෙවීම්, ලාභාන්තික, විකුණුම් ආදායම් හෝ හානිපූරණ වශයෙන් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද සියලු ගෙවීම් සහ ලැබෙන හෝ උපචිත වන ආදායම හා ප්‍රාග්ධන ලැබීම්, නේවාසික නොවන ආයෝජකයා විසින්, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල් වලින් විවෘත කර පවත්වා ගෙන යනු ලබන ආමුඛ ආයෝජන ගිණුමට බැර කරනු ලැබිය යුතු ය."

EOG 02 - 0119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.